www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

6 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 07 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති ව්‍යඤ්ජන අක්ෂර ගණන කීයද?

(1) 40 කි. (2) 18 කි. (3) 60 කි. (4) 42 කි.

02 මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුන වචනය තෝරන්න.

(1) ධනය (2) ටකය (3) අභය (4) ඛනිජ

03 ප්‍රථම පුරුෂ, පුරුෂ ලිංග, අතීතකාල ක්‍රියා පදය තෝරන්න.

(1) දුවයි (2) දුවන්නේ ය (3) දිවුවේ ය (4) දිවුවා ය

04 අනුක්ත රූප ගන්නා නාම පදය කුමක් ද?

(1) ගැහැනියක (2) මම (3) හාවෝ (4) තොපි

05 හල් කළ හැකි ව්‍යඤ්ජන අක්ෂරය වන්නේ කුමක් ද?

(1) ග (2) ඹ (3) ම (4) ඳ

06 දිගු පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල පිළිවෙළින් යෙදුණු වචනය තෝරන්න.

(1) පුලිඟු (2) ගුණැති (3) කුළුැටි (4) බූරුවා

07 වැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය වන්නේ කුමක් ද?

(1) ප්‍රතිඵල (2) ධක්ෂිණ (3) ඡායාව (4) ස්ථාවර



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

- **අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවලට සමානාර්ථවත් පදයක් තිත් ඉරි මත ලියන්න.**

08 දිවාකර ..........................................................................

09 රජතුමා ..........................................................................

10 ධජය ..........................................................................

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල විරුද්ධාර්ථවත් පදය තිත් ඉරි මත ලියන්න.**

11 සුලබ ..........................................................................

12 දොම්නස ..........................................................................

13 දිළිඳු ..........................................................................

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල පදවලට ගැළපෙන විශේෂණ පදයක් යොදා නැවත තිත් ඉරි මත ලියන්න.**

14 අඹයක් ..........................................................................

15 සිනාවෙයි ..........................................................................

16 ඇඬුවාය ..........................................................................

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

17 සොර මුළ සැඟවී ............................................ (පලා ගියේය / පලා ගියහ)

18 වෛද්‍යවරිය රෝගියා පරීක්ෂා ...................................... (කළේය / කළාය)

19 තොපි සියලු අභ්‍යාස .......................................................... (කරහි / කරහු)

20 පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ සහිතව නැවත තිත් ඉරි මත ලියන්න.

බොහොමඉක්මනටආවානේදයිවිමලාකීවාය

..........................................................................................................................................................

(ලකුණු 2 x 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

# II කොටස

- **ප්‍රශ්න අංක 01, 02, 03 ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(1) ගස්වැල් අපේ මිතුරෝ ය.

(2) සමගිය බලය වේ.

(3) වෙල් එළියේ සැඳෑවක්.

(4) උදෑසනක අසිරිය.

(5) සාරධර්ම සුරකිමු. (ලකුණු 20)

02 දොළොස්වෙනි උපන්දිනය සමරන ඔබේ සොහොයුරාට / සොහොයුරියට යවන සුබ පැතුම් පත සකස් කරන්න. (ලකුණු 10)

03 පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ලෙස සැලකෙන්නේ අතීතයේ සිට අප රටේ විසූ වැදි ජනයා ය. ඉන්දියාවේ සිට පැමිණි විජය කුමරුගේ සහ ඒ අවදියේ ලංකාවේ විසූ කුවේණි නැමති යක්ෂ ගෝත්‍රික කුමාරියගේ දරුවන් වූ ජීවහත්ථ හා දීසාලා යන දෙදෙනාගෙන් වැදි ජනයා පැවත එන බව බොහෝ දෙනාගේ අදහස වෙයි. විසිවන සියවස ආරම්භය තෙක් ම මුළුමනින් ම වනගත ජීවිතයක් ගත කළ වැදි ජනයා මේ වන විට අසල් වැසි සිංහල හා දෙමළ ගම්වල ජනයා හා මිශ්‍ර වී ඔවුන්ගේ සමාජ චාරිත්‍ර හා ජීවන රටා අනුගමනයෙන් වෙනස්වීම්වලට ලක් ව ඇත. වැදි ජනයා පිළිබඳව ඩී. ජී. සෙලිග්මාන් හා බ්‍රෙන්ඩා සෙලිග්මාන් යන විදේශීය විද්වතුන් මෙන් ම නන්දදේව විජේසේකර, පී. බී. මීගස්කුඹුර යන දේශීය විද්වතුන් ද පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියා ඇත. ආර්. එල්. ස්පිට්ල් වෛද්‍යවරයා වැදි ජනයා හා වෙසෙමින් ලත් අත්දැකීම් නිර්මාණාත්මක ප්‍රබන්ධ ස්වරූපයෙන් ලියා තැබී ය.

(1) ශ්‍රී ලංකාවේ ආදි වාසීන් ලෙස සැලකෙන්නේ කවුද?

(2) ජීවහත්ථ දිසාලා යන දරු දෙදෙනාගේ මව, පියා නම් කරන්න.

(3) ලංකාවේ විසූ කුවේණි නැමැති කුමාරිය කිනම් ගෝත්‍රක කාන්තාවක් ද?

(4) විසිවන සියවස ආරම්භය තෙක්ම වැදි ජනයා ගත කළේ කිනම් ජීවිතයක් ද?

(5) වැදි ජනයා පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියා ඇති විදේශීය විද්වතුන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු $2 \times 5 = 10$)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

04 සුදුසු අක්ෂරය යොදා හිස්තැන් පුරවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | අඹ පැ .......... ය | ( ල / ළ ) | (vi) | වෛද්‍ය පී .......... ය | ( ඨ / ට ) |
| (ii) | පරිච් .......... ද ය | ( චේ / ඡේ ) | (vii) | වි .......... ෂය | ( ශේ / ෂේ ) |
| (iii) | අවබෝ .......... ය | ( ද / ධ ) | (viii) | කුරු .......... උයන | ( ලු / ළු ) |
| (iv) | සං .......... සමූහය | ( ඝ / ග ) | (ix) | ප්‍රදර්ශ .......... ය | ( න / ණ ) |
| (v) | තර .......... ය | ( ග / ඟ ) | (x) | ක .......... මනාකරණය | ( ළ / ල ) |

(ලකුණු 1 x 10 = 10)

05 පහත දැක්වෙන අතීතකාල වාක්‍ය අනතීතකාලයට හරවා ලියන්න.

(i) මම පොළොන්නරුව නැරඹුවෙමි.

(ii) වෙළෙන්දා බඩු විකුණුවේ ය.

(iii) තෝ ගීතය ගායනා කළෙහි.

(iv) අම්මා වෙළෙඳපොළට ගියාය.

(v) කම්කරුවෝ පාර පිරිසිදු කළෝය. (ලකුණු 2 x 5 = 10)

06 පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) 'නරිනයිදේ රැවටිච්චී' පාඩම උපුටා ගත් ග්‍රන්ථයේ නම ලියන්න.

(ii) ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා විසින් ලියූ කෘතිය කුමක් ද?

(iii) 'කුමර ගී' පද්‍ය කෘතිය රචනා කළේ කවුද?

(iv) රොබට් නොක්ස්ගේ වාර්තා ඇසුරින් ලියැවුණු කෘතිය නම් කරන්න.

(v) බුදුන් වහන්සේගේ පූර්ව ජන්ම පිළිබඳ කතා ඇතුළත් කුරුණෑගල යුගයේ ලියැවුණ ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 2 x 5 = 10)

07 පහත උධෘත උපුටාගත් පාඩම්වල නම් ලියන්න.

(i) '' හා, හා, මම එහෙමත් කරනව ද'' ?

(ii) ''මා මොන යෝධයෙක් ද? මුවන්තිස්ස කුමාරයා නොවැ යෝධයා.''

(iii) ''දූන් ඉතින් ඔහොම කනගාටුවෙන් ඉන්න එපා.''

(iv) දුක සිතිලා ගම නෑයන් මතක් උණේ
ගම ඉඳලා වත් පණ යන්න නොලැබුණේ

(v) දිග හුවක් ඇසෙන්නට වියැ. (ලකුණු 2 x 5 = 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk